


# සමුපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
## கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
## Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**




| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>**My No.** | SP/CEC/1/O/5 | ඔබේ අංකය<br>உனது இல<br>**Your No.** | | දිනය<br>திகதி<br>**Date** | 2023.06. 13 |

චක්‍රලේඛ අංක 5/2023

දකුණු පළාතේ සියලුම සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

<u>සමුපකාර සේවකයින් සෞඛ්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීම.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් 2023.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සදහන් විධිවිධාන අනුව කටයුතු කරන ලෙස කොමිෂන් සභා නියොගය පරිදි දන්වමි.

02. ඒ අනුව,අයහපත් සෞඛ්‍ය හේතූන් මත සමුපකාර සේවකයෙකු තවදුරටත් සේවය කිරීමට යෝග්‍යතාවයක් නොමැති බවට වෛද්‍ය මණ්ඩලයක් විසින් නිර්දේශ කරනු ලැබූ විටදී එම සේවකයාට විශ්‍රාම ගන්නා ලෙස සමිතිය විසින් දැන්විය යුතුවේ.එහෙත් එම සේවකයා විශ්‍රාම ගැන්විය යුත්තේ විශ්‍රාම ගැනීමට කලින් ලබා ගැනීමට හිමිකම් ඇති නිවාඩු ඇත්නම් ඒවා අවසන් වන දිනයේ සිටය.

03. වයස අවු.55 සම්පූර්ණ වූ සමුපකාර සේවකයකුට සෞඛ්‍ය හේතු මත විශ්‍රාම යාමට අවශ්‍ය වන්නේ නම් සේවා යෝජකයාගේ එකගත්වය පරිදි විශ්‍රාම ගැනීමට හිමිකම් ඇත.

04. ඉහත සදහන් පරිදි වයස අවු.55 සම්පූර්ණවූ සමුපකාර සේවකයකු සෞඛ්‍ය හේතු මත විශ්‍රාම ගන්නා විටදී,විශ්‍රාම ගනු ලබන දිනය අවම වශයෙන් මාස 03කට කලින්වත් සේවා යෝජකයාට දැනුම් දිය යුතුය.

05. සමුපකාර සේවයෙහි අයහපත් සෞඛ්‍ය තත්වය මත සහනයක් අපේක්ෂා කරන සමුපකාර සේවකයින්ට සහන සැලසීම සදහා මෙම චක්‍ර ලේඛය නිකුත් කරනු ලැබේ.

කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ජයන්ත ජී. ලියනගේ.
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

ජයන්ත ජී. ලියනගේ
ලේකම් (වැ.බ.)
සමුපකාර සේවක කොමිෂන් සභාව
දකුණු පළාත

පිටපත -1. ලේකම්, කෘෂිකර්ම,ගොවිජන සංවර්ධන ........ සමුපකාර අමාත්‍යාංශය - දැ.ගැ.ස.

2. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්, දකුණු පළාත - කරු.සමු.සං.ප්‍රා.නි. හරහා අදාල සමිති දැනුවත් කිරීම සඳහා

3. දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුවට